# පුංචි යාලුවෝ



ඉනූෂි නෙත්සරා පීරිස්

කෘතියේ නම : පුංචි යාළුවෝ.

2025

කතෘ ප්‍රකාශනයකි.

ISBN: 978-624-208-741-2



කථාව සහ චිත්‍ර - ඉනූෂි නෙත්සරා පීරිස්.

පාසල - මහාමායා බාලිකා විද්‍යාලය,මහනුවර.

ඉගෙනුම ලබන පංතිය 3 වසර B

කර්තෘගේ වෙනත් කෘති: හිත හොඳ ගොවිරාල.

කෘතිය ප්‍රකාශිත දිනය: 2025.02.08

# පිදුම

කුඩාකල සිට අකුරු කියාදුන්
සියලුම ගුරුවරුන්ට සහ පියවරුන්ටත්
මාගේ දෙමව්පියන්ටත්
මෙම පොත ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ,දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර් පාසල් ප්‍රජාවම ආදි කර්තෘකරදන අත්තදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදායම රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණි ව්‍යාපෘතිය හඳුන්වාදෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනියෙන් මාහට අබිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාවය හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය ,

ශෂිකලා සේනාදීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

පැංචි කියන්නෙ පොඩි අලි පැටියෙක්. එයාට හොඳම යාළුවෙක් හිටියාඑයාගේ නම ලිලි. එයා චූටි කුරැල්ලෙක් .ඒ දෙන්න පොඩි කාලේ ඉඳන් හොඳම යාළුවෝ.



එයාලා ජීවත් වුණේ පුංචි කැලෑවක.

ඒ කැලෑව හරිම ලස්සනයි මල්, පලතුරු පිරිලා තියෙනවා.





දවසක් මේ යාළුවෝ දෙන්නා සෙල්ලම් කරන්න කැලේ ඇතුලට ගියා.


යන ගමන් වටේ තියෙන පලතුරු ගස්වලින් බඩ පිරෙනකම්ම පලතුරු කෑවා.



දවසම ගොඩක් සෙල්ලම් කලා.

වේලාව යනවාදැනුනෙම නෑ.

මහන්සි නිසාදෙන්නාටම හොඳටම ගහක් යට නින්ද ගියා.




දෙන්නටම ඇහැරුනේ ගොඩක් හවස් වුණාට පස්සේ.

"හොඳටම හවස් වෙලාඅපි  ගෙදර යමු"
අලි පැංචාකුරුලු පැටියාට කිව්වා.

‘’ඔව් අපි දැන් ගෙදර යමු, අම්මලාඅපිව
හොයනවාත් ඇති"


කුරුලු පැටියාකිව්වා.





දෙන්නම ගෙදර යන්න පිටත් වුණාට යන්න පාර මතක තිබ්බේ නැහැ.

යාළුවොදෙන්නාහොඳටම බය වෙලා



"කළුවර වේගෙන එන්නේ අපි ඉක්මනට පාර හොයාගන්න ඕනේ.

නැත්නම් නපුරු සත්තු  කරදර කරන්න පුළුවන්" අලි පැංචාකිව්වා.

"ඒත් අපි කොහොමද පාර හොයාගන්නේ!! අපිට පාර මතක නෑනේ"

කුරුලු පැංචා කිව්වා

" ඔයා උඩට පියාඹාගෙන ගිහිල්ලා අපේ ගෙදර තියෙන පාර හොයාගන්න.

එතකොට ඔයාට පුළුවන්නේ මට හරියට පාර කියන්න" අලි පැංචා කිව්වා.


ඒ වෙලාවේ තමයි කුරුලු පැටියාට මතක් වුණේ.

එයාගේ ගෙදර කැලේ මැදට පේනවා කියලා.



කුරුලු පැටියාඅහස උඩට පියාඹාගෙන ගිහිල්ලා අලියාලුවට පාර කිව්වා.

දෙන්නාම සතුටින් ගෙදර ගියා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතාකොටගත් අනාගත පරපුරේ හැ කියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැ ගම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් ගත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘ තිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙසේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලාවැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප , පළාත් , ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහාපිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායාබාලිකාවිද්‍යාලයේ විදුහල්පති තුමිය , දියණියන් , ගුරුභවතුන් , දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකියි මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතුවී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේ පාසැල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායාබාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගාදී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචිගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂින්සන.

ව්‍යාපෘති නිර්මාතෘසම්බන්ධීකාරක ,

සෙනවිරත්න මහලේකම්.